**ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය පාර්ලිමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව, රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව, දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර, ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 16 - පාර්ලිමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානවලට අනුගත නොවීම** | **නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොකිරිම | 2.1.3 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. ලේඛන හා පොත් යාවත්කාලීන නොකිරිම . | 2.9. හා 2.10 |
| | | 2. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.6 |
| | | 3. කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ අඩුපාඩු | 2.11 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය | 2.1.1 |
| | | 2. කාර්යසාධන ඇගැයීමට තොරතුරු ඉදිරිපත් නොකිරිම | 2.1.2 |
| | | 3. ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගති වාර්තා | 2.1.4 |

| | | | |
|---|---|---|---|
| | | පිලියෙල නොකිරිම | |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.2.2 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම | 2.4 |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා ගැනීම | 2.7(අ) |
| | | 3. ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම | 2.7.(ආ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ අඩුපාඩු | 2.8(අ) |

| | | | |
|---|---|---|---|
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | හානි පිළිබඳ වගකීම | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 2.1.1 පාර්ලිමේන්තු සැසිවාර

2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා 08 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් වාර 95 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණි. එම රැස්වීම් වාර 95 කින් රැස්වීම් වාර 43 ක් සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් මන්ත්‍රීවරු 150 දෙනෙකුට වඩා වැඩියෙන් සහභාගී වී තිබුණි. රැස්වීම් වාර 52 ක් සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 150 දෙනෙකුට වඩා අඩුවෙන් සහභාගීවී තිබුණි. තවද ගරු මන්ත්‍රීවරුන් 200 දෙනෙකුට වඩා වැඩි සහභාගීත්වයෙන් යුතුව රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි.

### 2.1.2 ඉංජිනේරු අංශයේ කටයුතු

පාර්ලිමේන්තු කටයුතු වෙනුවෙන් ඉංජිනේරු අංශයක් පැවතියද, එම අංශයේ කාර්යසාධනය මැන බැලීම සඳහා අවශ්‍ය දත්ත එම අංශය විසින් පවත්වා නොතිබුණි. ඒ අනුව එම අංශ යටතේ වන කාර්මික නිලධාරීන්ගේ ලිඛිත කාර්ය පැවරුම් පවත්වා නොගැනීම, ඉංජිනේරු අංශයේ නිලධාරින් විසින් ගබඩාවෙන් ලබා ගන්නා ද්‍රව්‍ය භාවිතා කර සිදු කර ඇති කාර්යයන් පිළිබඳව තොරතුරු පවත්වා නොගැනීම, දිනපතා ඉංජිනේරු අංශයෙන් බැහැරව යන නිලධාරීන් කුමන කාර්යයක් සඳහා බැහැරව යන්නේද යන්න සනාථ කිරීම සඳහා විධිමත් ලේඛන පවත්වා නොගැනීම, සී.සී.ටී.වී අංශයට හා කටුනායක නිල නිවස සඳහා අනුයුක්ත කාර්මික නිලධාරීන්ගේ අමතර රාජකාරී වෙනුවෙන් ගබඩාවෙන් නිකුත් කර ඇති ද්‍රව්‍ය පරිහරණය කර ඇති ආකාරය පිළිබඳව තොරතුරු පවත්වා නොගැනීම වැනි අඩුපාඩු රාශියක් පැවතුණි.

### 2.1.3 සැලැසුම් කිරීම

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත්, එහි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) ඇතුළත් කර නොතිබුණි.

### 2.1.4 ප්‍රගති වාර්තා පිළියෙල කිරීම

ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින්, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කළ යුතු, වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, පාර්ලිමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත්, එම සැලැස්ම 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

(ඇ) ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා සහ ආහාරපාන හා නිල ඇඳුම් වැය විෂයයන් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට සලසාගෙන තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 150 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණු නමුත්, ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රසම්පාදන කාලසටහන් පාර්ලිමේන්තුව විසින් පිළියෙල කර නොතිබීම නිසා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1(ආ) හා (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වා නියමිත දින වකවානු තුළ ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණු බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

-----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාර්ලිමේන්තු සභාගර්භය සඳහා ගුවන් ප්‍රචාරණ තත්ත්වයේ සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කර බැලීම සහ ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය යටතේ 2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 500 ක් හා රු.මිලියන 160 ක් වශයෙන් එකතුව රු.මිලියන 660 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් ඉහත සඳහන් කාර්ය සඳහා 2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 106 ක් හා රු.මිලියන 122 ක් වශයෙන් එකතුව රු.මිලියන 228 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ii) ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 200 ඉක්මවූ මෙම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 2.8.2 මාර්ගෝපදේශ ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් සිදු කළ යුතුව තිබුණත්, එසේ නොකර අමාත්‍යාංශය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් විසින් ලංසු කැඳවීම හා ලංසු විවෘත කිරීම, තාක්ෂණික යෝජනා ඇගයීම් සිදු කර නිර්දේශයන් ලබා දීම, ලංසු ලියවිලි ඇගයීම, එක් ලංසුවක් ප්‍රතික්ෂේප කිරීම හා ඉතිරි ආයතන දෙකෙහි මූල්‍ය යෝජනා විවෘත කිරීම ආදී ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කර තිබුණි. නමුත් 2016 ජූලි 23 දිනැති අංක PFD/PMD/03/97 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි මෙම ප්‍රසම්පාදනයේ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ක් ඉක්මවන හෙයින් ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට දැනට නම් කර ඇති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට කර ගෙන යා නොහැකි බව දන්වා තිබුණි. ඒ අනුව 2016 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩලය ප්‍රසම්පාදන කමිටුවක් පත් කර තිබුණු අතර, එම කමිටුව විසින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව ලබා දී තිබුණු ඉහත සඳහන් තීරණ වෙනස් නොකර ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කර තිබුණි.

(iii) LED රූපවාහිනී යන්ත්‍ර 120 ක් රු.මිලියන 8.375 කට මිලදී ගැනීමට හා රූපවාහිනී යන්ත්‍ර සවිකිරීමේ වියදම් රු.575,000 ක් 2017 පෙබරවාරි 05 දින වන විට කොන්ත්‍රාත්තුව අවසන් බවට සහතික කර ගෙවා තිබුණි. එදින වන විට එසේ සවිකර නිම කළ බව සඳහන් කර තිබුණු රූපවාහනි යන්ත්‍රවලින් බිත්ති රැඳවුම් (Wall Brackets) රූපවාහිනී යන්ත්‍ර 29 ක් සවිකර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන කමිටුව විසින් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණු LED රූපවාහිනී යන්ත්‍ර 124 ක් තුළ නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවූ රූපවාහිනී යන්ත්‍ර සවිකර තිබුණු නමුත්, ස්ථාන භාර නිලධාරී විසින් ඒවා සහතික කිරීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශයට අනුකූල වන ලෙස පිරිවිතරවල වෙනස්කම් සඳහන් කර නොතිබුණි.

(v) ලංසු කැඳවීමේ ලේඛනවල කොන්දේසි හා නියමයන් අනුව මෙම පද්ධතිය සැපයීම හා සවිකිරීම පාර්ලිමේන්තුව වෙත භාරදීම යනාදී කාර්යයන්වලට පසු ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා සෑහීමකට පත්වන්නේ නම් පමණක් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 75 ක් ගෙවිය හැකි බව දක්වා තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් සියයට 20 ක් වූ රු.17,458,723 ක් 2016 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එහෙත් නියමිත විධිවිධානවලට පටහැනිව, කාර්යය ආරම්භ කිරීමට පෙර, දේශීය සැපයුම්වලින් ලැබුණු ප්‍රමාණය සඳහා වූ වටිනාකමෙන් (supply items of the site) සියයට 75 ක් ලෙස රු.21,701,519 ක්ද, නැවත එදිනම වෙනත් වවුචරයකින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(vi) කොන්ත්‍රාත්කරු විසින් පද්ධතිය ස්ථාපනය කර වර්ෂ 03 ක් දක්වා, නඩත්තු කටයුතු නොමිලේ කරදෙන බව ලංසු කැඳවීමේ ලේඛනවල කොන්දේසි හා නියමයන්හි සඳහන් කර තිබුණි. නමුත් වර්ෂ 03 කට පසුව සිදු විය හැකි නඩත්තු කටයුතු සහ වාර්ෂික සේවා කිරීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි.

(vii) ලංසු නියමයන් ප්‍රකාරව මෙම පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.16.45 දක්වා පමණක් සිදුකළ යුතු විය. එහෙත් සති අන්ත දිනයන් සහ රාත්‍රී කාලයන් වශයෙන් දින 14 ක් මෙම කාර්යය සඳහා යොදා ගෙන තිබුණු බව ලිපි ලේඛන අනුව නිරීක්ෂණය විය. එසේ තිබියදී සති අන්ත දිනයන් සහ රාත්‍රී කාලයේ සේවය කිරීමට නොහැකිවීම පිළිබඳව හේතු දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කර තිබූ ඉල්ලීම විධිමත් විමර්ශනයකින් තොරව ප්‍රධාන සම්බන්ධීකරණ ඉංජිනේරුවරයා විසින් අනුමත කර තිබුණි.

(viii) මෙම පද්ධතියේ කාර්යයන් අවසන් කර නොතිබුණු නමුත්, පද්ධතියේ කටයුතු නිම කළ බවට ඉංජිනේරු අංශයේ නිලධාරීන් සහතික කිරීම නිසා කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට හැකිව තිබුණු සියයට 5 ක ප්‍රමාද ගාස්තු වන රු.මිලියන 11.4 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ix) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 2, 8 හා 12 වගන්ති ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර, ලංසුකරු සහ ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණි. තවද එසේ ලියාපදිංචි කළ බවට සහතිකයක් ඉදිරිපත් නොකරන කොන්ත්‍රාත්කරුවන් සමග අදාළ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කිසිදු ගනුදෙනුවක් නොකළ යුතු වුවත්, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පාර්ලිමේන්තුවේ ප්‍රවාහන කටයුතු සඳහා 2016 හා 2017 වර්ෂවලදී අවස්ථා 03 කදී ලංසු කැඳවා රු.මිලියන 67.51 ක් වැය කර බස් රථ 06 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, මෙම ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඇගයීමේ සාරාංශ වාර්තා පිළියෙල කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයන් විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව නියමිත පරිදි ප්‍රකාශයන් අත්සන් කර නොතිබුණු අතර, සම්මත ලංසු කැඳවීමේ ලේඛනයද පිළියෙල කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරුවන්

වෙත ලංසු සුරක්ෂණයන් පිළිබඳව නිවැරදි උපදෙස්ද ලබාදී නොතිබුණු අතර, ඒ හේතුවෙන් ලංසුකරුවන් විසින් එවන ලද ඒකාකාරී නොවන සුරක්ෂණ සහිත මිල ගණන්ද ඇගයීමට ලක් කිරීමට සිදු කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශයෙහි සඳහන් අරමුණුවලට පටහැනිව ලංසු ඇගයීම සිදු කර තිබුණු අතර අදාළ බස් රථ භෞතික පරීක්ෂාවෙන් පසුව එක් ලංසු කරුවකුගෙන් පමණක් මගී දොර දෙක සහිත ආසන 50 ක වායුසමීකරණ බස් රථ සඳහා නැවත මිල ගණන් සහ පිරිවිතර ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එහෙත් අදාළ ලංසුකරු සතුව බස්රථ තොග නොමැති වීම හේතුවෙන් නැවත මිල ගණන් කැඳවීමට ආයතන 09 ක් වෙත ලංසු ආරාධනා ලිපි යොමු කර තිබුණි.

(iii) තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු ඇගයීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධානවලට පටහැනිව, ප්‍රසම්පාදන අවස්ථා තුනේදීම, ලංසුවල බදු සහිත මිල සැලකිල්ලට ගෙන තිබුණි. එම නිසා පළමු ප්‍රසම්පාදන අවස්ථාවේ ලංසු ඇගයීමේදී, තාක්ෂණ ඇගයීම් කමිටුව විසින්, බදු රහිත අවම මිල ලංසුව ඉදිරිපත් කර තිබුණු රු.15,467,544 ක ලංසුව, දෙවන අවම මිල වශයෙන්ද, බදු සහිත අවම මිල ලංසුව ඉදිරිපත් කර තිබුණු රු.16,650,000 ක ලංසුව, අවම මිල වශයෙන්ද, වැරදි ආකාරයට හඳුනා ගෙන තිබුණි.

(iv) බස් රථ භෞතික පරීක්ෂාවකට ලක් නොකර, අවශ්‍ය පිරිවිතර සමග බස් රථවල විස්තර පත්‍රිකා (Catalogue) පමණක් සැසඳීම සිදු කර තිබුණි. එම තොරතුරු අනුව බස්රථවල පිරිවිතර සමග තෘප්තිමත් විය නොහැකි බවත්, පාර්ලිමේන්තුවට පැමිණෙන විදේශ නියෝජිතයන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා එම බස් රථ නොගැලපෙන බවත්, සඳහන් කරමින් එම ලංසුද ප්‍රතික්ෂේප කර තිබුණි. වායු සමීකරණ බස් රථ 02 ක් මිලදී ගැනීම සඳහා නැවත නව ලංසු කැඳවීමට 2017 මැයි 08 දින ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි.

(v) එකතුව පිළිවෙලින් රු.23,089,266 ක් හා රු.15,525,000 ක් වූ පළමු සහ දෙවන ප්‍රසම්පාදන අවස්ථාවලදී අදාළ ආයතන සමග ලියා අත්සන් කර තිබුණු කොන්ත්‍රාත් ගිවිසුම්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ), 8.9.3 හා අංක NPA/Goods/SBD 01 දරන ලේඛනයේ දැක්වෙන සම්මත ගිවිසුම් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර නොතිබුණි. එසේම මෙම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර, ලංසුකරු සහ ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණු අතර, ලියාපදිංචි කළ බවට සහතිකයක්ද ලබා ගෙන නොතිබුණි.

(ඇ) පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබාදීම සඳහා රු.මිලියන 2.98 ක් වැය කර තිබුණි. එම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව මෙම ප්‍රසම්පාදන කාර්ය වෙනුවෙන් ප්‍රසම්පාදන කාල සටහන කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදනය ආරම්භයේදී නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමේදී අවශ්‍ය රෙදි ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා නිල ඇඳුම් හිමි සේවක සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(iii) ඇණවුම් කර මාස 05 ක ප්‍රමාදයකින් පසුව නිල ඇඳුම් රෙදි සපයා තිබුණත්, ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කොන්දේසි ප්‍රකාරව රු.63,604 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතුව තිබුණත්, එසේ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(iv) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 4 ක කාල පරිච්ඡේදයක් තුළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 151 දෙනෙකු නිල ඇඳුම් ලබා ගෙන නොතිබුණි. ඒ වෙනුවෙන් සිදු කර තිබුණු වියදම නිෂ්කාර්ය වී තිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පාර්ලිමේන්තුව සතු වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) අභ්‍යන්තර පාලන ක්‍රමයක් ලෙස පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී තිබුණු ගෘහස්ථ යෙදවුම් 05 ක්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වාහන 28ක ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

(ඇ) විධිමත් ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකර ටයර් මිලදී ගැනීම, විධිමත් පරිදි ගබඩා නොකිරීම, තොග පිළිබඳ සැලකිලිමත් නොවී පසුගිය වර්ෂවලදී ඇණවුම් කළ ප්‍රමාණයම පදනම් කරගෙන තොග ඇණවුම් කිරීම හා 2012 වර්ෂයේ ගංවතුරට හසුවී තිබුණු තොග විධිමත් පරිදි බැහැර නොකිරීම යන හේතු නිසා 2017 අගෝස්තු 17 දිනට ටයර් 385 ක්, ටියුබ් 344 ක් හා රිම් 51 ක් ගබඩාවේ රඳවා ගෙන තිබුණි. එම ටයර් යොදා ධාවනය කළ හැකි වාහනද, පාර්ලිමේන්තුව සතුව නොතිබුණු බැවින් භාවිතා නොකරන ලද ටයර් 127 ක්, ටියුබ් 302 ක් හා රිම් 17 ක් අපහරණය කර තිබුණි. සැපයුම් අංශයේ ගබඩාව සඳහා හඳුන්වා දී තිබුණු පරිගණක මෘදුකාංගය, 2017 වර්ෂය දක්වා භාවිතා නොකිරීම හා ටයර් සම්බන්ධ තොග පොත්වල වටිනාකම් සඳහන් කර නොතිබීම හේතුවෙන් ඉහත අපහරණය කරන ලද ටයර්, ටියුබ් හා රිම් තොගයෙහි වටිනාකම් ගණනය කිරීමට නොහැකි විය.

(ඈ) 2017 අගෝස්තු 17 දින වන විට පාර්ලිමේන්තුව සතු වාහන සඳහා නිර්දේශිත ටයර් 258 ක වගකීම් කාලය ඉක්මවා තිබුණත්, ඒවා වාහන සඳහා භාවිතා නොකර ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඉ) 2018 මාර්තු 16 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී දුරකථන හුවමාරු කාමරයේ තිබිය යුතු ප්‍රධාන ඔරලෝසු පද්ධතියට අයත් රු.267,900 ක් වටිනා MP Envy 13 Care 17 අංක දරන ලැප්ටොප් පරිගණකය එහි නොතිබුණි.

(ඊ) පාර්ලිමේන්තුවේ ස්ථාපිත විදුලි සෝපාන 12 ක අලුත්වැඩියා කටයුතු සඳහා යොදා ගන්නා වර්ග 201 කින් යුතු ඒකක 3,871 ක අමතර කොටස්, ඉංජිනේරු අංශයේ ගබඩාවේ පැවතුණි. විදුලි සෝපාන සේවා ආයතනය විසින් අලුත්වැඩියා සඳහා අවශ්‍ය අමතර කොටස්, ඉංජිනේරු අංශයේ ගබඩාවෙන් ලබාගෙන නැවත ප්‍රතිපූර්ණය කරන බැවින්, ආරම්භයේ පැවති අමතර කොටස් තොගය 2018 ජූලි 04 දින වන විටත් නොවෙනස්ව පැවතුණි.

## 2.4 බැඳීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) හි සඳහන් විධිවිධානවලට අනුකූල නොවී වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.මිලියන 7.54 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.602,107 ක බැරකම්, විසර්ජන ගිණුමෙන් හෙළිදරව් කර නොතිබුණි.

## 2.5 හානි පිළිබඳ වගකීම

සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුව සතු වාහනවලට අවස්ථා 11 කදී එකතුව රු.මිලියන 3.18 ක අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

පාර්ලිමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.2(අ) | අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සහ උසස් කිරීමේ පරිපාටිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| 2015 | 5.3(අ)(v) | 2008 මැයි 02 දිනැති අංක ඩීඑම්එස්/සී/4/පී/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් පරිදි ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම නොපමාව ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 2013 | 1.6(අ)(i) | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් ලබා නොගෙන වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලබාදී තිබුණි. |

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2016 | පුනරාවර්තන | 1,857 | 1,816 | 41 | 2.21 |
| | මූලධන | 580 | 336 | 244 | 42.06 |
| | **එකතුව** | **2,437** | **2,152** | **285** | **11.69** |
| 2017 | පුනරාවර්තන | 2,482 | 2,444 | 38 | 1.53 |
| | මූලධන | 523 | 398 | 125 | 23.90 |
| | **එකතුව** | **3,005** | **2,842** | **163** | **5.42** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 17 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) ආංශික කාරක සභා ඇතුළුව පාර්ලිමේන්තුව නවීකරණය කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉන් කිසිදු උපයෝජනයක් නොකර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පාර්ලිමේන්තුවට අදාළ විෂය අංක 01601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 39.00 | 38.43 | 30.00 | 31.31 | 175.00 | 130.57 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ 2017 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,883,013 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට පාර්ලිමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.50,147 ක වෙනසක් පැවතුණි.

**2.9 පොදු තැන්පත් ගිණුම**

පාර්ලිමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 7.73 ක් වී තිබුණි. ඒ අතරින් අංක 6000/000/00/0016/0040/000 දරන පොදු තැන්පත් ගිණුමෙහි ශේෂය රු.1,820,001 ක් වී තිබුණත්, ඒ සඳහා පොදු තැන්පත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පාර්ලිමේන්තුව විසින් පහත සඳහන් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454 (1) |
| (ii) | මෝටර් වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1645 හා 1647(ඉ) |
| (iii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**2.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය යටතේ රු.මිලියන 1,063.65 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | 02 |
| (ii) | තෘතියික මට්ටම | | | 15 |
| (iii) | ද්විතියික මට්ටම | | | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | | | 24 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | | | 01 |

| | |
|---|---|
| තාවකාලික | |
| **එකතුව** | **-----** |
| | **75** |
| | **===** |

සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය 843 දෙනෙකුගෙන් 487 දෙනෙකු පුහුණු කිරීමට සැලැසුම් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ඉන් නිලධාරීන් 470 ක් රු.3,285,719 ක් වැය කර පුහුණු කර තිබුණි.